# 2019 ජනවාරි මස මාසික සභා රැස්වීම

## වැලිගෙපොල ප්‍රාදේශීය සභාව

2019 ජනවාරි මස මාසික සභා රැස්වීම 2019.01.10 වන දින පෙ.ව.10.00 ට ගරු සභාපති කැළුම් ප්‍රියංකර ජයසිංහ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේදී පවත්වනු ලැබීය.

එදින සභා රැස්වීමට පහත නම් සඳහන් අය සහභාගී වූහ.

1. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ජී.ජී.සිසිර ප්‍රේමකුමාර මැතිතුමා
2. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ආර්.ඒ.රෝහණ විජේරත්න මැතිතුමා
3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩී.බුද්ධික විරසිංහ මැතිතුමා
4. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩී.එච්.සිරිපාල මැතිතුමා
5. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඒ.එම්.ඉන්ද්‍රජිත් සමන්ජීව මැතිතුමා
6. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී - අචිනි එස්.අබේවික්‍රම මැතිතුමිය
7. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එල්.ඒ.ගුණතිලක මැතිතුමා
8. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එම්.ආර්.රත්නපාල මැතිතුමා
9. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඒ.එම්.අයි.පී.රණතුංග මැතිතුමා
10. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එච්.ඒ.දමිත් විජේරත්න මැතිතුමා
11. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී - එන්.වී.ශ්‍රීමාවතී මැතිතුමිය
12. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - පී.ජී.ශාන්ත දෙල්ගහකොට්ටුව මැතිතුමා
13. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ජී.එල්.ලාල් කුමාරරත්න මැතිතුමා
14. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩී.කේ.ප්‍රසාද් අසිත මැතිතුමා
15. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී - ඒ.ඩබ්ලිව්.සුමනාවතීමැතිතුමිය
16. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී - පී.ආර්.එස්.ධම්මිකා මැතිතුමිය
17. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ටී.සී.සිසිර කුමාර ඉසුරුමුණි මැතිතුමා
18. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එන්.ජී.යූ.ඩබ්ලිව්.කුමාර මැතිතුමා

## නිලධාරී සහභාගීත්වය

1. ප්‍රාදේශීය සභාවේ ලේකම් - එස්.රත්නාවතී මැණිකේ මෙනවිය
2. කළමනාකරණ සහකාර - එච්.ඒ.පී.එන්.හෙට්ටිආරච්චි මිය

මෙදින සභා රැස්වීමට සහභාගී වූ ගරු සභාපති තුමා විසින් ගරු මන්ත්‍රී මණ්ඩලයත්,ලේකම් තුමිය ඇතුළු කාර්ය මණ්ඩලයත්,මාධ්‍යවේදී මහතාත් පිළිගැනීමෙන් අනතුරුව සභාවේ කටයුතු ආරම්භ කරන ලදී.

## 1. පසුගිය සභා රැස්වීමේ වාර්තාව සභා සම්මත කිරීම

2018.12.13 වන දින පැවති මාසික සභා රැස්වීම් වාර්තාවේ 5.1.(i) ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීඑන්.ජී.යූ.ඩබ්.කුමාර මැතිතුමාගේ අදහස් දැක්වීමේ ''සභාවට ගෙන ආ බොහොමයක් යෝජනා අතරින් එකක්වත් ඉටුකර ගැනීමට නොහැකි වීම''යනුවෙන් සඳහන් වීම ''සභාවට ගෙන ආ බොහොමයක් යෝජනා අතරින් එකක්වත් ඉටුකිරීමට නොහැකි වීම''යනුවෙන් සංශෝධනය විය යුතු බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.ජී.යූ.ඩබ්.කුමාර මැතිතුමාවිසින් සඳහන් කරන ලදී.තවද 5.1(i) යෝජනාවේ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී එන්.වී.ශ්‍රීමාවතී මැතිතුමියවිසින් "2019 වර්ෂය සඳහා පිළියෙල කරන ලද අයවැයට සිය සුභාශිංසන පල කළාය."යනුවෙන් දක්වා තිබුණද තමන් ඒ සඳහා සුභපැතුම් එක් නොකල බවද එතුමිය විසින් සඳහන් කිරීමෙන් අනතුරුව,2018.12.13 වන දින පැවති මාසික සභා රැස්වීම් වාර්තාව සත්‍ය වාර්තාවක් බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ජී.සිසිර ප්‍රේමකුමාර මැතිතුමා විසින් යෝජනා කරන ලදුව එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එච්.සිරිපාල මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් පසුව ඒකමතිකව සභා සම්මත විය.

## 2. <u>ගරු සභාපතිතුමාගේ නිවේදන</u>

**I. පළාත් පාලන ආයතනවල මහජන නියෝජිතයින්ගේ රාජකාරි ගමන් වියදම් සඳහා යොදා ගන්නා වාහන ,යතුරුපැදි සඳහා ඉන්දන දීමනාව ලබාගැනීම සඳහා ප.පා.කො.චක්‍රලේඛ 03/2012 සංශෝධනය කිරීම.**

ඉහත චක්‍රලේඛය ප්‍රකාරව ඉදිරියේදී මහජන නියෝජිත නියොජිතවරියන්ට තමා නමින් නොමැති වාහනයක් භාවිතා කිරීම වෙනුවෙන්,

1. පැවරුම් ලිපියක්
2. රක්ෂණ සහතිකයේ පිටපතක්
3. ආදායම් සහතිකයේ පිටපතක්

ලබා දීමෙන් ඉන්දන දීමනාව ලබා ගත හැකි බව නිවේදනය කරන ලදී.

**II.** පුහුණු වැඩසටහන්

- රත්නපුර දිස්ත්‍රික්කයේ සියළුම පළාත් පාලන කාන්තා නියෝජිතවරියන් දැනුවත් කිරීමේ වැඩසටහනක් ශ්‍රී ලංකා පළාත් පාලන ආයතනයන්ගේ සංසඳය විසින් 2019.01.31 වන දින පුස්සැල්ල පුහුණු මධ්‍යස්ථානයේදී පැවැත්වීමට කටයුතු සූදානම් කර ඇති බව සභාවට නිවේදනය කරන ලදී.

- පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය විසින් පළාත් පාලන ආයතන වල මහජන නියෝජිතයින් සඳහා පළාත් පාලනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවක් පවත්වන බව දන්වා ඇති අතර ඒ සඳහා අයදුම් කිරීමට හැකි බව නිවේදනය කරන ලදී.

**III.** අක්කර බදු ලේඛනයෙන් නම වෙනස් කිරීම.

- බී.වී.හීන්මහත්මයා මහතාට හිමිව තිබූ අක්කර බදු අංක 12 දරණ ඉඩම බී.වී.චම්පා කුමුදු කුමාරි මිය,බී.වී.නිමාල් නිල්මිණී මිය,බී.වී.චන්ද්‍රිකා ශ්‍රියානි මිය,බී.වී.සුසන්ත සේනක මයා යන අයවළුන් විසින් මිලදී ගෙන ඇති නිසා බී.වී.හීන්මහත්මයාගේ නම අක්කර බදු ලේඛනයෙන් ඉවත්කර දෙන ලෙස ඉල්ලා ඇති බව සභාවේ දැනගැනීම සඳහා ඉදිරිපත් කරන ලදී.
- ආර්.පී.විමලවංශ නමින් ඇති අක්කර බදු අංක 71 දරණ ඉඩමට ආර්.පී.සීලවතී නමින් අක්කර බදු ලේඛනයේ නම වෙනස් වන බව සභාවේ දැන ගැනීම සඳහා ඉදිරිපත් කරන ලදී.

## 3. සභාව නමින් ලැබී ඇති ලිපි, පෙත්සම් හා පැමිණිලි ඉදිරිපත් කිරීම

### 3.1. නිවාඩු අනුමත කර ගැනීම.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්ලිව්.ඒ.සමන්ජීවලාල් වීරසිංහ මැතිතුමාඅසනීප වීම හේතුවෙන් අද දින සභා රැස්වීමට සහභාගී නොවන බව දන්වා එවා ඇති බැවින්,නිවාඩු අනුමත කිරීම සුදුසු බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එච්.සිරිපාල මැතිතුමාවිසින් යෝජනා කිරීමෙන් හා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.ඒ.රෝහණ විජේරත්න මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් පසුව එම නිවාඩු අනුමත විය.

**3.2.** වැලිගෙපොල මාළු ලැල්ල 2019 වර්ෂයට ටෙන්ඩරය ලබා ගත් මොරතොට පී.එම්. ප්‍රියන්ත සුසිල් කුමාර පලන්සූරිය මහතා ගිවිසුම අත්සන් කිරීමට නොපැමිණි අතර දෙවන ටෙන්ඩර්කරු විසින් ඉදිරිපත් කල මිල ගණන් අවම ලංසුවට වඩා අඩු වූවක් බැවින් ,නැවත ටෙන්ඩර් කැඳවීමට සභාව සාකච්ජා කර තීරණය කරන ලදී.

## 4. යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න

යථා පරිදි කල්දී ඇති ප්‍රශ්න කිසිවක් නොවීය.

## 5. කල් දී ඇති යෝජනා

### 5.1. ගරු සභාපති කැළුම් ප්‍රියංකර ජයසිංහ මැතිතුමා

I. ප්‍රාදේශීය සභා පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව 2019 වර්ෂය සඳහා පහත සඳහන් පරිදි උපදේශක කාරක සභා පත් කර ගැනීමේ යෝජනාව ගරු සභාපතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලදී.

1.මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කමිටුව

(අ). ගරු සභාපති කේ.ඕ.කැළුම් ප්‍රියංකර ජයසිංහ මැතිතුමා

(ආ). ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සිසිර ප්‍රේමකුමාර මැතිතුමා

(ඇ). ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එච්.සිරිපාල මැතිතුමා

(ඈ). ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.ඒ.දමිත් විජේරත්න මැතිතුමා

(ඉ). ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.ජී.යූ.ඩබ්.කුමාර මැතිතුමා

2.නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටුව

(අ). ගරු සභාපති කේ.ඕ.කැළුම් ප්‍රියංකර ජයසිංහ මැතිතුමා

(ආ). ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.ජී.ශාන්ත දෙල්ගහකොට්ටුව මැතිතුමා

(ඇ). ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.බුද්ධික විරසිංහ මැතිතුමා

(ඈ). ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී පී.ආර්.එස්.ධම්මිකා මැතිතුමිය

(ඉ). ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි අචිනි එස්.අබේවික්‍රම මැතිතුමිය

3.කාර්මික සේවා කමිටුව

(අ). ගරු සභාපති කේ.ඕ.කැළුම් ප්‍රියංකර ජයසිංහ මැතිතුමා

(ආ). ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්.ඒ.ගුණතිලක මැතිතුමා

(ඇ). ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්.ඉන්ද්‍රජිත් සමන්ජීව මැතිතුමා

(ඈ). ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.ආර්.ප්‍රසාද් අසිත මැතිතුමා

(ඉ). ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී ඒ.ඩබ්.සුමනාවතී මැතිතුමිය

4.පරිසර හා පහසුකම් කමිටුව

(අ). ගරු සභාපති කේ.ඕ.කැළුම් ප්‍රියංකර ජයසිංහ මැතිතුමා

(ආ). ගරු උප සභාපති ඩබ්.ඒ.සමන්ජීවලාල් වීරසිංහ මැතිතුමා

(ආ). ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.එල්.ලාල් කුමාරරත්න මැතිතුමා

(ඇ). ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ආර්.රත්නපාල මැතිතුමා

(ඈ). ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී ඒ.ඩබ්.සුමනාවතී මැතිතුමිය

5. ප්‍රසම්පාදන කමිටුව

(අ). ගරු සභාපති කේ.ඕ.කැළුම් ප්‍රියංකර ජයසිංහ මැතිතුමා

(ආ). ගරු උප සභාපති ඩබ්.ඒ.සමන්ජීවලාල් වීරසිංහ මැතිතුමා

(ඇ). ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.ඒ.රෝහණ විජේරත්න මැතිතුමා

(ඈ).ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්.අයි.පී.රණතුංග මැතිතුමා

(ඉ).ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.සී.සිසිර කුමාර ඉසුරුමුණි මැතිතුමා

(ඊ).ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී එන්.වී.ශ්‍රීමාවතී මැතිතුමිය

(උ).ප්‍රාදේශීය සභාවේ ලේකම් එස්.රත්නාවතී මැණිකේ මෙනවිය

(ඌ). තාක්ෂණ නිලධාරී ඒ.එස්.ප්‍රදීප් මයා

(එ).සංවර්ධන නිලධාරී කේ.ඒ.රොෂාන් කුරුප්පු ආරච්චි මයා

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ජී.සිසිර ප්‍රේම කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.අනතුරුව 2019 ගරු සභාපතිතුමා විසින් ඉදිරි පත් කරන ලද කාරක සභා පත් කිරීමේ යෝජනාව සංශෝධනයකින් තොරව සභා සම්මත විය.

II. සේවා ගිවිසුම් මත සේවයේ යොදවා සිටින පහත නම් සඳහන් සේවකයින්ගේ සේවා ගිවිසුම අලුත් කිරිම සුදුසු බව යෝජනා කරන ලදී.

- එස්.ඩබ්ලිව්.තුෂාර ඉන්ද්‍රවිජිතමයා - වැඩ ක්ෂේත්‍ර කම්කරු
- එච්.ඩී.සමන්ත චමිල කුමාර මයා - සෞඛ්‍ය කම්කරු
- බී.වී.රසික ප්‍රසාද් මයා - රියදුරු
- එල්.පී.එන්.ටී.ගුණවර්ධන මයා - පුස්තකාල සහයක
- කේ.බුද්ධිකා ප්‍රියදර්ශනී පෙරේරා මෙනවිය - ණැනසල ක්‍රියාකරු

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එච් සිරිපාල මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් පසුව ඒකමතිකව සභා සම්මත විය.

III. වරිපනම් බදු අයකරන දේපල සඳහා නව තක්සේරුව ලබා ගැනීම.

ප්‍රාදේශීය සභා පනතේ 134(1) වගන්තිය ප්‍රකාරව මෙම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ දියුණුගම් ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කර ඇති පහත සදහන් ප්‍රදේශ වල දේපල නැවත තක්සේරු කිරීම සුදුසු බව යෝජනා කරන ලදී.

- පැල්මඩුල්ල පාර (වම/දකුණ)
- බළන්ගොඩ පාර (වම/දකුණ)
- මීදෙල්ලදෙනිය (වම/දකුණ)
- විජයරාම පාර (වම/දකුණ)
- ගුඩ්ෂෙඩ් පාර (වම/දකුණ)
- මොරවිටිවල පාර (වම/දකුණ)

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්.අයි.සමන්ජීව මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ඒ අනුව එක් එක් දේපල නැවත තක්සේරු කිරීම වසර 5 කට වරක් සිදුකල යුතුව ඇති බව ගරු සභාපතිතුමා විසින් පැහැදිළි කිරීමෙන් අනතුරුව මෙම සභාවේ 6% ක් වූ වරිපනම් බදු ප්‍රතිශතය නොවෙනස්ව අයකර ගැනීම සඳහා ඉහත දේපල නැවත තක්සේරු කිරීමට අදාල යෝජනාව ඒකමතිකව සභා සම්මත කරන ලදී.

අනතුරුව සභාපතිතුමා විසින් පහත සඳහන් යෝජනා ද සභාවට ඉදිරිපත් කරන ලදී.

IV. ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ආවරණය වන පරිදි කොට්ඨාශ මට්ටමින් ජංගම සේවා වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම සුදුසු බවත්,

V. මහජන සෞඛ්‍යට අදාල අණපනත් ක්‍රියාත්මක කිරීම සඳහා මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ට බල තල පැවරීම අවශ්‍ය බවත්,

VI. පැළැන්දකන්ද ජල යෝජනා ක්‍රමයට ලීටර් 10000ක ටැංකියක් ලබා ගැනීම හා කැන්දකැටිය ජල මූලාශ්‍රයට අළුතින් ටංකියක් ඉදිකිරීම අවශ්‍ය බවත්,

VII. ලියන්වින්න ජල යෝජනා ක්‍රමය කි.මී. 1ක් දීර්ඝ කිරීමට අගල් දෙකේ බට මිල දී ගැනීම අවශ්‍ය බවත්,

VIII. ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ මැතිවරණ කොට්ඨාශ 10 ආවරණය වන පරිදි ප්‍රාදේශීය සභාවෙන් විධිමත්ව සේවා සැපයීම සඳහා සැලසුම් කිරීම සුදුසු බවත්,

IX. වැලිගෙපොල හා ඕපනායක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ දෙකම ආවරණය වන පරිදි ක්‍රීඩා පිටි දෙකක් සංවර්ධනය කිරීමඅවශ්‍ය බවත්,යෝජනා කරන ලදී.

ගරු සභාපතිතුමාගේ iv සිට ix දක්වා වූ යෝජනා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.ඒ.රෝහණ විජේරත්න මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් පසු ඒකමතිකව සභා සම්මත විය. තවද ,ගරු සභාපතිතුමා විසින් ,

X. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ දෙකේ ලියාපදිංචි ක්‍රීඩා සමාජ 20ක් සඳහා වොලිබෝල් 20ක් හා නෙට් 20ක් ලබා දීම සුදුසු බව යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ජී.සිසිර ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ඉහත යෝජනාව සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා වැඩිදුරටත් අදහස් දක්වමින් , ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ලියාපදිංචි ක්‍රියාකාරී ක්‍රීඩා සමාජවල අභිවෘද්ධිය පිණිස ක්‍රීඩා උපකරණ ලබාදීමේ අවශ්‍යතාව පැහැදිලි කලේය. එමෙන්ම 2019 වර්ෂය සඳහා පිළියෙල කරන ලද අයවැය ඇස්තමේන්තුව තුල ප්‍රාග්ධන ස්වරූපයේ වැඩ සැලසුම් සඳහා එක් මන්ත්‍රීවරයෙකු වෙනුවෙන් රු.100,000/= ක මුදලක් වෙන් කර ඇති අතර එම මුදල් ප්‍රමාණය ප්‍රාග්ධන ස්වරූපයේ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමට ප්‍රමාණවත් නොවන බැවින් එම වැය ශීර්ෂය යටතේ වියදම් කිරීමට සිය යෝජනාවට අදාලව සභා අනුමැතිය ලබා දෙන ලෙස ඉල්ලා සිටි බැවින් එකී යෝජනාව විෂය භාර ගරු අමාත්‍යතුමාගේ /ආණ්ඩුකාරතුමාගේ පූර්ව අනුමැතියට යටත්ව ක්‍රියාත්මක කිරීම සුදුසු බව සභාව විසින් ඒකමතිකව ස්ථිර කරන ලදී.

XI. අළුතින් සවි කිරීමට වීපී පහන් 100ක් හා වීපී පහන් 100ක් අළුත්වැඩියාවට අවශ්‍ය උපාංග ලබා ගැනීම අවශ්‍ය බවත්,

XII. ප්‍රාදේශීය සභා මාර්ගවලට අවශ්‍ය හියුම් පයිප්ප ලබා ගැනීම සඳහාත් සභා අනුමැතිය ලබා දෙන ලෙස ගරු සභාපතිතුමා විසින් ඉල්ලා සිටින ලදී.

එමෙන්ම, ගරු සභාපතිතුමා විසින් හදිසි යෝජනා යටතේ පහත යොජනාව සභාවට ඉදිරිපත් කරන ලදී.

XIII. ප්‍රසිද්ධ ස්ථාන වල ඇති තාප්ප වල දැන්වීම් ඇලවීම තහනම් මැයෙන් පුවරු සවි කිරීම සුදුසු බව යෝජනා කරන ලදී.

ඉහත අංක xi සට xiii දක්වා සියළු යෝජනා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.බුද්ධික වීරසිංහ මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

සිය යෝජනා සම්බන්ධයෙන් වැඩිදුරටත් අදහස් දැක්වූ ගරු සභාපතිතුමා ,මෙම සභාව විසින් ගෙන යන කසල කළමනාකරණ වැඩසටහනට සමගාමීව බල ප්‍රදේශයේ ප්‍රසිද්ධ ස්ථාන සහ නගර ආශ්‍රිතව ඇති තාප්ප වල දැන්වීම්/පෝස්ටර් ඇලවීම නිසාත්, අවසරයකින් තොරව ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය කර තිබීම නිසාත් නගර

අලංකරණයට බාධා පැමිණ ඇති අතර, පාරිසරික වශයෙන්ද ගැටළු උද්ගතව ඇති බව සඳහන් කරමින් මේ දින වල අනවසර දැන්වීම් පුවරු ඉවත් කිරීමට කටයුතු යොදා ඇති බැවින් ,ඉදිරියේදී ඒවා විධිමත් කිරීමට යම් වැඩපිළිවෙලක් දියත් කලයුතුව ඇති බව සඳහන් කලේය.ඒ අනුව නගරාශ්‍රිතව විධිමත් දැන්වීම් පුවරුවක් (දැකුම් පැළැල්ලක් )ස්ථාපනය කිරීමට උපකාරක පන්ති පවත්වන්නන් සමඟ සාකච්ඡා කල බවත්,ඉදිරියේදී සභාවට ආදායමක් ලබා ගත හැකි පරිදි විධිමත් දැන්වීම් පුවරු සවි කිරීමත් සමඟම දැන්වීම් ඇලවීම නිසා අපිරිසිදු වී ඇති තාප්ප නගර අලංකරණයට හිතකර අයුරින් ශුද්ධ පවිත්‍ර කර දැන්වීම් ඇලවීම තහනම් මැයෙන් දැන්වීම් ප්‍රදර්ශනය කිරීමට කටයුතු කිරීම අවශ්‍ය බවත් පෙන්වා දෙන ලදී

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.ජී.යූ.ඩබ්ලිව්.කුමාර මැතිතුමා විසින් මෙම අවස්ථාවේදී අදහස් ප්‍රකාශ කරමින් ,ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද xii වෙනි යෝජනාව අනුව හියුම් පයිප්ප ලබා දීමේදී ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන් විසින් හියුම් පයිප්ප ලබා දෙන ලෙසට ඉදිරිපත් කර ඇති යෝජනා සම්බන්ධයෙන් ප්‍රමුඛතාව ලබා දෙන ලෙස ඉල්ලා සිටින ලදී.එමෙන්ම සභා බල ප්‍රදේශයේ අවිධිමත් ලෙස ප්‍රදර්ශනය කෙරෙන දැන්වීම් පුවරු ඉවත් කිරීමත් සමඟ ඒ සඳහා විධිමත් වැඩ පිළිවෙලක් සකස් කිරීමේ අවශ්‍යතාව පෙන්වා දෙන ලදී.තවද ව්‍යාපාරික ස්වරූපයෙන් නොවන දේශපාලනික හෝ වෙනත් ආකාරයේ දැන්වීම් ඉවත් නොකරන ලෙසටද ඉල්ලීමක් කලේය.

ප්‍රචාරක දැන්වීම් පුවරු සම්බන්ධයෙන් තව දුරටත් කරුණු දැක්වූ ගරු සභාපතිතුමා පෞද්ගලික පන්ති පවත්වන ආයතන සමඟ මේ සම්බන්ධයෙන් සාකච්ඡා කල බවත්,ස්ථිර දැන්වීම් පුවරුවක් සකස් කිරීමට රු.25000/= ක පමණ මුදලක් වැය කල යුතු වුවත් එවැනි දැන්වීම් පුවරු 15 ක් පමණ සකස් කර ගැනීමට ඉදිරියේදී ක්‍රියාමාර්ගයක් ගන්නා බවත් ප්‍රකාශ කලේ ය.

මෙම අවස්ථාවේදී ලැබුවා වූ 2019 වසර සියළු දෙනාට සුභ නව වසරක් වේවායි සුභාශිංසනය කරමින් අදහස් ප්‍රකාශ කල ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.සී.එස්.කේ.ඉසුරුමුණි මැතිතුමා ප්‍රකාශ කර සිටියේ සභාවේ සියළු දෙනා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා මහජන සේවාවක් සිදුවන ආකාරයෙන් ක්‍රියාත්මක කල යුතු බවයි.වීථිපහන් සවි කිරීමේ වැඩසටහන දෙස බලන විට ගෙවී ගිය කාලය තුල සභාගත කල යෝජනා කොතෙක් දුරට සලකා බැලුවාද යන්න පැහැදිලි වන බවත් සඳහන් කරමින් ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට යෝජිත වැඩ පිළිවෙල තුල සමතුලිතතාවක් අපේක්ෂා කරන අතර එය සාධනීය පියවරක් ලෙස ගෙනයායුතු බවත් පැවසුවේය.

ගරු සභාපතිතුමා විසින් ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වැඩ පිළිවෙ සම්බන්ධයෙන් මෙලෙස කරුණු අනාවරණය කලේය.

ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී ප්‍රේමලාල් ජයසේකර මැතිතුමාගේ මූලා ප්‍රතිපාදන මත ඕපනායක කොට්ඨාශය තුල නම් කරන ලද ස්ථාන වල වීථි පහන් 11ක් සවි කිරීමට සභාව ක්‍රියාකාරී ආයතනයක් ලෙස කටයුතු කල බවත්,කොට්ඨාශ මට්ටමින් ක්‍රියාත්මක කිරීමට යෝජිත ජංගම සේවා වැඩ සටහන ඔස්සේ අත්‍යාවශ්‍ය ස්ථාන වල වීථි පහන් සවි කිරීමට කටයුතු යොදන බවත්,සඳහන් කලේය.එමෙන්ම ගල්පාය,බඹරගල,හඳගිරිය ප්‍රදේශ ආවරණය වන පරිදි සංචාරක කලාපයක් ඇති කිරීමේ සක්‍යතාව සොයා බැලීම පිණිස ප්‍රධාන ලේකම් තුමිය ඇතුළු කණ්ඩායමක් පැමිණිමට නියමිත බවත් පැවසුවේය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.ඒ.රෝහණ විජේරත්න මැතිතුමා ද ඉහත කරුණු දැක්වීම් සම්බන්ධයෙන් මෙලෙස සිය අදහස් ඉදිරිපත් කලේය.

සභා බල ප්‍රදේශයේ සංවර්ධිත කටයුතු උදෙසා කුමන හෝ මූලාශ්‍රයන් හරහා වුවද ලැබෙන ප්‍රතිපාදන ඵලදායී අයුරින් යෙදවිය යුතුවාක් මෙන්ම ඒ සම්බන්ධයෙන් අදාල කොට්ඨාශය නියෝජනනය කරන ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන්ගේ දැනුවත් භාවය මත අදාල කාර්ය ඉටු කලයුතු බව පෙන්වා දෙන ලදී. එමෙන්ම ගරු සභාපතිතුමා විසින් ගෙන යන වැඩපිළිවෙල විධිමත් සැලැස්මකට අනුව සිදුකරන ලෙසත් ,දැනට පවතින ජල ව්‍යාපෘතිවල ගැටළු නිරවුල් කර ගැනීම පිණිස විකල්ප විසඳුම් සොයා ඒ අනුව කටයුතු කලයුතු බවත් අවධාරණය කලේ ය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී එන්.වී.ශ්‍රීමාවතී මැතිතුමියද ඊට කරුණු එක් කරමින් සභා බල ප්‍රදේශ ආවරණය වන කොට්ඨාශ 10ටම සමාන ප්‍රතිපාදන සැලසෙන ලෙස වැඩ සැලසුම් පිළියෙල විය යුතු බව සඳහන් කරමින් ඒ සඳහා අදාල කොට්ඨාශය නියෝජනය කරන මන්ත්‍රීතුමන්ලාගේ යෝජනා ලබා ගෙන ජන සභා හරහා ඒවා ප්‍රමුඛතා ගත කරන මෙන් ඉල්ලා සිටියාය.

ඉහත ගරු මන්ත්‍රීතුමන්ලාගේ හා මන්ත්‍රීතුමියගේ අදහස් දැක්වීමට අනුව ගරු සභාපතිතුමා තව දුරටත් අදහස් දක්වමින් ඕපනායක කොට්ඨාශය තුල විමධ්‍යගත අරමුදල් යටතේ වීථි පහන් සවි කිරීමේ යෝජනාවට අකමැත්ත පල වුවත්, දේශපාලනික වශයෙන් මත ගැටුමක් ඇතිවිය හැකි බැවින් එම කාර්ය ඉටුකලත් ඉදිරියේදී නම් කර එවන ලද ස්ථාන සඳහා වීථිපහන් සවි කිරීමට අදාලව ප්‍රාදේශීය ලේකම් හරහා එන යෝජනා ප්‍රතික්ෂේප කිරීමට සභා තීරණයක් ගැනීම සුදුසු බව ප්‍රකාශ කරන ලදුව ඊට සභාව එකඟ විය.තවද සභව මගින් පවත්වාගෙන යන ජල යෝජනා ක්‍රම සම්බන්ධවද සළකා බැලීමේදී එවායෙහි ආරම්භක

අවස්ථාවේදී සිටින ලද පාරිභෝගික සංඛ්‍යාවට වඩා මේවන විට ප්‍රතිලාභීන් සංඛ්‍යාව විශාල වශයෙන් වැඩිවී ඇති නිසා ඊට සාපේක්ෂව මුලින් එළන ලද ජල නල ප්‍රමාණවත් නොවන බැවින් ඉඩෝර කාලයේදී උස්තැන්වල සිටින ජනතාවට ජල සැපයුම ලබා දීමට නොහැකි තත්වයක් උදා වී ඇති බැවින් එම ස්ථාන වල අළුතින් ජලනල එළීමේ අවශ්‍යතාව පදනම් කරමින් අංක vii යෝජනාව ඉදිරිපත් කල බවද සඳහන් කලේය.

## 5.2. ගරු ප්‍රාදේශීය සභා උප සභාපති ඩබ්ලිව්.ඒ.සමන්ජීවලාල් වීරසිංහ මැතිතුමා

ගරු උප සභාපතිතුමා සභා රැස්වීමට නොපැමිණි බැවින් ,එතුමා විසින් න්‍යාය පත්‍ර ගත කරන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එච් සිරිපාල මැතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලදී.

I. කොලොන්ගස්යාය ක්‍රීඩා පිටිය සංවර්ධනය කිරීම අවශ්‍ය බැවින්,ඒ සඳහා සභා අනුමැතිය ඉල්ලා සිටියේය.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්.අයි.සමන්ජීව මැතිතුමා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

## 5.3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එච්.සිරිපාල මැතිතුමා

ගරු මන්ත්‍රීතුමා විසින් පහත යෝජනා සභාවට ඉදිරිපත් කරන ලදී.

I. මැටිහක්වල ගල්ලින්න වත්ත මාර්ගය ඉතිරි කොටස කොන්ක්‍රිට් කිරිම අවශ්‍ය බවත්,

II. මල්මීකන්ද මැදවත්ත මාර්ගය කාණු දමා මට්ටම් කිරිම අවශ්‍ය බවත්,

යෝජනා කරන ලදී.එම යෝජනා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.ජී.ශාන්ත දෙල්ගහකොට්ටුව මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් පසු ඒකමතිකව සභා සම්මත විය.

## 5.4. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.ජී.ශාන්ත දෙල්ගහකොට්ටුව මැතිතුමා

ගරු මන්ත්‍රීතුමා විසින්,

I. මඩවලලන්ද දෙණිය මාර්ගයට බොරළු දමා සකසා දීම අවශ්‍ය බවත්,
II. මුත්තෙට්ටුපොල ඉලුක්කැටිය මාර්ගයට බොරළු දමා සකස් කිරිම අවශ්‍ය බවත්,
III. පුස්සතොට අක්කර 25 අතුරු මාර්ගයට බොරළු දමා සකස් කිරිම අවශ්‍ය බවත්,
IV. ගල්පාය තාලිගමයාය සිට කඩවල ආර දක්වා මාර්ගයට විදුලි ලාම්පු සවි කිරිම අවශ්‍ය බවත්,
V. බඹරගල බඹරගලයාය මාර්ගයට බොරළු දමා සකස් කිරිම අවශ්‍ය බවත්,

යෝජනා කරන ලදී. එම යෝජනා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්.අයි.සමන්ජීව මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් පසු ඒකමතිකව සභා සම්මත විය.

### 5.5. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්.අයි.සමන්ජීව මැතිතුමා

ගරු මන්ත්‍රීතුමා විසින් අම්බැවිල නාන තොටුපොලක් ඉදිකිරීමේ අවශ්‍යතාව පෙන්වා දුන් අතර ඒ සඳහා සභා අනුමැතිය ඉල්ලා සිටියේය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.බුද්ධික වීරසිංහ මැතිතුමාඑම යෝජනාව ස්ථිර කරමින්,අම්බැවිල වැව ආශ්‍රිතව නාන තොටුපලක් ඉදි කිරීම සුදුසු බවත්,සභාවට ආදායම් මාර්ගයක් ඒ තුලින් උදාවන බවත් පෙන්වා දුන් අතර ,එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 6. <u>කාරක සභා වාර්තා සලකා බැලීම.</u>

## 6.1. 2018.12.21 වන දින පැවති මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කමිටු වාර්තාව

කාරක සභාවේ තීරණ අංක 303-336 දක්වා වූ වියදම් එදින කාරක සභාවට යොමු කරන ලද අතර,එම වියදම් මහ සභාවේ සලකා බැලීම පිණිස ඉදිරිපත් කරන ලදී.

## 7. ආදායම් වියදම් වාර්තා

## 7.1. 2018.නොවැම්බර් මස ආදායම් වියදම් වාර්තාව

| ලැබීම් සාරාංශය (රුපියල්) | | වැය සාරාංශය (රුපියල්) | |
|---|---|---|---|
| වරිපනම් බදු | 552,855.73 | වැටුප් හා දීමනා | 2,523,401.86 |
| කුලී | 66,013.37 | ගමන් වියදම් | 21,808.80 |
| බලපත්‍ර ගාස්තු | 47,400.00 | සැපයුම් හා උපකරණ | 428,280.53 |
| සේවා සඳහා ගාස්තු | 92,220.00 | ප්‍රාග්ධන වත්කම්අළුත්වැඩියාහා නඩත්තුව | 435,876.55 |
| වරෙන්තු ගාස්තු | 355,257.94 | ප්‍රවාහන සම්බන්ධතා හා ආවශ්‍යක සේවා | 248,051.28 |
| වෙනත් ආදායම් | 5,475,382.69 | පොලී ගෙවීම් ලාභාංශ හා ප්‍රසාද මුදල් | - |
| වෙනත් ආධාර | 2,211,167.10 | ආධාර මුදල් දායක මුදල් සහනාධාර | - |
| පුනරාවර්ථන ආදායම් එකතුව | 8,800,296.83 | විශ්‍රාම වැටුප්,විශ්‍රාම ප්‍රතිලාභ,හා පාරිතෝෂික | 18,162.55 |
| මූලධන ලැබීම් | - | පුනරාවර්තන වියදම් එකතුව | 3,675,581.57 |
| ප්‍රාග්ධන ආදායම් එකතුව | - | ප්‍රාග්ධන වැය | 504,000.00 |

| | | | |
|---|---|---|---|
| පුනරාවර්ථන ප්‍රාග්ධනආදායම් එකතුව | 8,800,296.83 | ණය ආපසු ගෙවීම් | - |
| සේවක ණය | 107,212.78 | සේවක ණය | - |
| තැන්පත් | 77,544.36 | තැන්පත් | 923,388.02 |
| අත්තිකාරම් | 20,000.00 | ණයහිමි | - |
| ණය ගැති(කර්මාන්ත) | - | අත්තිකාරම් | 155,250.00 |
| සමුච්චිත අරමුදල | 790,370.06 | ජල ගබඩා | - |
| | | ගබඩා(ඖෂධ) | - |
| වෙනත් ලැබීම් එකතුව | 995,127.20 | සමුච්චිත අරමුදල | - |
| | | වෙනත් ගෙවීම් | - |
| | | වෙනත් ගෙවීම් එකතුව | 1,078,638.02 |
| මුළු එකතුව | 9,795,424.03 | මුළු ගෙවීම් | 5,258,219.59 |

## 7.2. 2018 නොවැම්බර් 31 දිනට ආදායම් අය කිරීමේ ප්‍රගති වාර්තා

| අනු අංකය | ආදායම් ප්‍රභවය | 2017.12.31 ට හිඟ | 2018 වර්ෂයේ ඇස්තමේන්තුගත ආදායම | 2018.11.31 දිනට හිඟයන් එකතු කළ ප්‍රමාණය | | මෙම වර්ෂයේ ඇස්තමේන්තුගත මුදලෙන් එකතු කල | | අයකිරිමට ඇති ඉතිරිය | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | මුදල රු. | ප්‍රතිශතය | මුදල රු. | ප්‍රතිශතය | ඇස්තමේන්තුගත ආදායමෙන් | හිඟයන් |
| 1 | වරිපනම් බදු 1.11 | 4703281 | 1940000 | **246432** | **5%** | **649426** | **33%** | **1290574** | 4456849 |
| 2 | අක්කර බදු 1.12 | 71142 | 20900 | **8107** | **11%** | **5849** | **28%** | **15051** | 63035 |
| 3 | සැපයුම් කරුවන් ලියාපදිංචි කිරීම1.43 | | 125000 | | | **130671** | **105%** | **(5671)** | |
| 4 | ව්‍යාපාර බදු 2.16 | | 255000 | - | | **272400** | **107%** | **(17400)** | |
| 5 | වෙළෙඳ බලපත්‍ර ගාස්තු2.31 | | 730000 | - | | **844250** | **116%** | **(114250)** | - |
| 6 | පරිසර බලපත්‍ර ගාස්තු2.37 | | 30000 | | | **45150** | **151%** | **(15150)** | |
| 7 | ලියාපදිංචි සහතික හා පරීක්ෂණ ගාස්තු | | 458000 | | | **144543** | **32%** | **313457** | |
| 8 | ජල ගාස්තු 4.14 | 1868941 | 6075000 | 1529453 | **82%** | **4400361** | **72%** | **1674639** | 339488 |
| 9 | විකුණුම් | | 497000 | | | **175393** | | | |
| 10 | යන්ත්‍ර කුළියට දීම3.25(2)/3.25(3) | | 1050000 | | | **251550** | **24%** | **798450** | |

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| 11 | වාහන නැවතුම්පල ගාස්තු 5.43 | | 300000 | | | | 0% | 300000 | |
| 12 | ගොඩනැඟිලි බලපත්‍ර3.43(4) | | 250000 | | | 110549 | 44% | 139451 | |
| 13 | පොදු වෙළඳපල කුළී | | | | | | | | |
| 14 | මස්කඩ මාළු කඩ කුලී 5.23(2) | 133193 | 428000 | 78135 | 59% | 150500 | 35% | 277500 | 55058 |
| 15 | ප්‍රමාද ගාස්තු | | 110000 | | | 72827 | 66% | 37173 | |
| 16 | විනෝද බදු 6.15 | | 1000 | | | - | 0% | 1000 | |
| 17 | සතිපොළ ගාස්තු5.23(1) | 25880 | 254000 | 20880 | 81% | 222935 | 88% | 31065 | 5,000.00 |
| 18 | නිවාස කුලී | | | | | | | | |
| 19 | දැන්වීම් පුවරු ගාස්තු1.37 | | 400000 | | | 458000 | 115% | (58000) | |
| 20 | ජල බවුසරය කුළියට දීම 4.25 | | 300000 | | | 109800 | 37% | 190200 | |
| 21 | ක්‍රීඩා පිටිය කුලියට දීම 6.25 | | 2000 | | | 0 | 0% | 2,000 | |
| 22 | වෘත්තීය බලපත්‍ර 1.33 | | 100 | | | - | 0% | 100 | |
| 23 | පොලී ආයෝජන 1.61 | | 500 | | | | 0% | 500 | |
| 24 | සේවක ණය පොලී1.64 | | 40000 | | | 47003 | 118% | (7003) | |
| 25 | අයකර ගතහැකි ගාස්තු2.43 | | 25000 | | | 3150 | 13% | 21850 | |
| 26 | සභාව සතු ගොඩනැගිලි3.25.1 | | 1000 | | | 1,500.00 | 150% | (500) | |

| අනු අංකය | ආදායම් ප්‍රභවය | 2017.12.31 ට හිඟ | 2018 වර්ෂයේ ඇස්තමේන්තුගත ආදායම | 2018.11.31 දිනට හිඟයන් එකතු කළ ප්‍රමාණය | | මෙම වර්ෂයේ ඇස්තමේන්තුගත මුදලෙන් එකතු කල | | අයකිරීමට ඇති ඉතිරිය | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | මුදල රු. | ප්‍රතිශතය | මුදල රු. | ප්‍රතිශතය | ඇස්තමේන්තුගත ආදායමෙන් | හිඟයන් |
| 27 | දඩ අනවසර ඉදිකිරීම් 3.52 | | 500 | | | - | - | 500 | |
| 28 | අය කර ගත හැකි ගාස්තු 4.43 | | 1000000 | | | 867022 | 87% | 132978 | |
| 29 | විශේෂ සැපයුම් සඳහා ගාස්තු4.16 | | 5000 | | | - | - | 5000 | |
| 30 | පොළ භූමිය කුලියට දීම5.25 | | 1000 | | | 300.00 | 0.30 | 700 | |

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 31 | ක්‍රීඩා පිටි ටකරන් මඩු කුලියට දීම6.25 | | 2000 | | | 0 | 0% | 2000 | |
| | **වෙනත් ආදායම්*** | 15279 | 878140 | 15279 | 100% | 582255 | 66% | 295885 | |
| | **මුළු එකතුව** | **6791836** | **15179140** | **1898287** | **28%** | **9545433** | **63%** | **5312100** | **4919429** |

වෙනත් ආදායම්*

| අනු අංකය | ආදායම් ප්‍රභවය | 2017.12.31 ට හිඟ | 2018 වර්ෂයේ ඇස්තමේන්තුගත ආදායම | 2018.07.31 දිනට හිඟයන් එකතු කළ ප්‍රමාණය | | මෙම වර්ෂයේ ඇස්තමේන්තුගත මුදලෙන් එකතු කල | | අයකිරීමට ඇති ඉතිරිය | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | මුදල රු. | ප්‍රතිශතය | මුදල රු. | ප්‍රතිශතය | ඇස්තමේන්තුගත ආදායමෙන් | හිඟයන් |
| 1 | ලියාපදිංචි කිරීමේ සහතික හා පරීක්ෂණ ගාස්තු | | | | | | | | |
| 2 | ඉඩම් හා ගොඩනැගිලි බදු දීම් | | | | | | | | |
| 3 | පා පැදි බලපත්‍ර 1.35 | | 150 | | | 8.00 | 5% | 142 | |
| 4 | වරිපනම් සංශෝධන ගාස්තු | | | | | | | | |
| 5 | වැසිකළි කුලියට දීම | | | | | | | | |
| 6 | කසල ඉවත් කිරීමේ ගාස්තු 2.13 | 5000 | 107000 | 5,000.00 | 1.00 | 42,000 | 39% | 65000 | - |
| 7 | සභා භූමිය කුලියට දීම | | | | | | | | |
| 8 | පාරවල් පළුදු වීම වෙනුවෙන් ගාස්තු | | | | | | | | |
| 9 | නොපවරවා ගැනීමේ සහතික ගාස්තු 3.43.(1) | | 200000 | | | 65000 | 33% | 135000 | |
| 10 | පුස්තකාල සේවා ගාස්තු 6.43 | | 15000 | | | 9790 | 65% | 5210 | |
| 11 | පුස්තකාල දඩ 6.52 | | 20000 | | | 4197 | 21% | 15,803 | |
| 12 | ඉඩම් විකිණීම මත බදු | | | | | | | | |
| 13 | ඉඩම් බදු 3.24 | 10279 | 448390 | 10279 | 100 % | 383860 | 86% | 64530 | - |
| 14 | වෙළෙඳ ස්ථාන කුලී03.22 | | 87600 | | | 77400 | 88% | 10,200.0 | |
| | එකතුව | 15279 | 878140 | 15279 | 100 % | 582255 | 66% | 295885 | - |

## 8. පසුගිය සභා රැස්වීමේ ප්‍රගතිය සමාලෝචනය කිරීම

පසුගිය සභා රැස්විමට ඉදිරිපත් වූ යෝජනා විෂය නිලධාරීන් වෙත යොමුකර ඇති බවත්, උඩවෙල පොදු වැසිකිළියක් සෑදීමට ඉඩම් කොටසක් ඉල්ලා පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂකට යැවූ ලිපියට ලද පිළිතුරු ලිපි සභාවට ඉදිරිපත් කරන ලදී.

## 9. වෙනත් කරුණු

### 1. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.ජී.යූ.ඩබ්.කුමාර මැතිතුමා

I. ඕපනායක දෙල්ගස්හංදියෙන් ආරම්භ වන හත්තැල්ල මාර්ගය ගල්කන්ද දක්වාම අබලන්ව ඇති බවත් විශේෂයෙන් දැඩි ලෙස අබලන්ව ඇති ස්ථාන හේතුවෙන් මගී ජනතාවට බොහෝ දුෂ්කරතා මතුව ඇති බවත්,පෙන්වා දුන් ගරු මන්ත්‍රීතුමා,පාසල් කාලයද ආරම්භ කර ඇති බැවින්,එම මාර්ගය ඉතා ඉක්මනින් සංවර්ධනය කර දෙන ලෙස නැවත පළාත් මාර්ග අමාත්‍යාංශයෙන් හා නව ආණ්ඩුකාරතුමාගෙන් ඉල්ලීමක් කරන ලෙස ඉල්ලා සිටියේය.

II. හත්තැල්ල -ගල්කන්ද මාර්ගයේ ර/ දන්දෙනිය විද්‍යාලයට හැරෙන ස්ථානයට ඉදිරියෙන් ඇති දුරකථන කණු දෙකක් හේතුවෙන් මාර්ග අවහිරතාවයන් ඇති බවට කරුණු අනාවරණය කල ගරු මන්ත්‍රීතුමා එම දුරකථන කණු දෙක සුදුසු ස්ථානයක නැවත ස්ථානගත කර දෙන මෙන් ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනයෙන් ඉල්ලීමක් කරන ලෙස ඉල්ලා සිටියේය.

### 2. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.ඒ.රෝහණ විජේරත්න මැතිතුමා

I. දෙල්ගස්හංදිය හා මල්මීකන්ද මාර්ගය ආරම්භ වන ස්ථානයේ රථවාහන නතර කර තැබීම නිසා මගී ජනතාවට දුෂ්කරතා රැසක් මතුව ඇති බවට කරුණු අනාවරණය කල ගරු මන්ත්‍රීතුමා එම කරුණ සම්බන්ධව මාර්ග සංවර්ධන අධිකාරිය දැනුවත් කරන ලෙස ඉල්ලා සිටියේය.

II. ර/හුණුවල ධර්මරාජ මහ විද්‍යාලය අසල කාණුව ගොඩවී ඇති බවට මීට පෙර සභා වාරයකදී කල අනාවරණයට අනුව විධායක ඉන්ජිනේරු වෙත යැවූ ලිපියට ප්‍රමාණවත් පිළිතුරක් නොලැබුණු හෙයින් නැවත ලිපියක් යොමු කරන ලෙස ඉල්ලා සිටියේය.

III. හුණුවල දාන්දාව පාලම දැඩි ලෙස අබලන්ව ඇති බැවින් ,අනතුරක් සිදු වීම වැලැක්විය නොහැකි බව පෙන්වා දුන් ගරු මන්ත්‍රීතුමා එම පාලම ප්‍රතිසංස්කරණය කිරීමට ප්‍රතිපාදන සළසා දෙන මෙන් පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයෙන් ඉල්ලීමක් කල යුතු බව සඳහන් කලේය.

IV. මැටිහක්වල හල්ලින්න මාර්ගය දැඩිලෙස අබලන්වීම නිසා ගමනා ගමන දුෂ්කරතා රැසක් මතුව ඇති බව පෙන්වා දෙමින් ,මාර්ග නඩත්තුව සඳහා වෙන් කර ඇති මුදලින් එම මාර්ගයේ නඩත්තු කටයුතු සිදුකර දෙන මෙන් ඉල්ලා මහා මාර්ග අමාත්‍යාංශයෙන් හා මාර්ග සංවර්ධන අධිකාරියෙන් ඉල්ලීමක් කරන ලෙසට ඉල්ලා සිටියේය.

### 3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී පී.ආර්.එස්.ධම්මිකා මැතිතුමිය

I. ඌරාවල යටිපස්ගමුව ප්‍රධාන මාර්ගය කි.මී.1 ක ප්‍රමාණය සංවර්ධනය කර ඇතත් එම මාර්ගයේ තවත් කි.මී. 1ක ප්‍රමාණය සංවර්ධනය කල යුතුව ඇති බැවින් ,එම මාර්ගයේ ඉතිරි කොටස සංවර්ධනය කර දෙන මෙන් විධයක ඉංජිනේරු වෙතින් ඉල්ලීමක් කල යුතු බව ප්‍රකාශ කලාය.

II. ඌරාවල විද්‍යාල මාවත දෙපස වල් බිහිවී ඇති බැවින් ,ගමනා ගමන දුෂ්කරතා මතුව ඇති අතර සභාවේ JCB යන්ත්‍රය යොදවා පිළිසකර කර දෙන මෙන් ඉල්ලා සිටියාය.

### 4. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්.අයි.සමන්ජීව මැතිතුමා

I. හිරිකැටිය ප්‍රදේශයේ තිරිවානා හා සෙල්ස්ෆා කැනීමේ ව්‍යාපාරය සඳහා කිසිදු ක්ෂේත්‍ර පරීක්ෂණයකින් තොරව පරිසර නිර්දේශ ලබා දීම නිසා ප්‍රදේශයේ ජනතාවට විශාල පරිසර හානියක් සිදුව ඇති බවට කරුණු අනාවරණය කල ගරු මන්ත්‍රීතුමා ,සෙල්ස්ෆා කැනීම හේතුවෙන් හංවාන,තලගස්කන්ද,බඳුල්ලෙගම ප්‍රදේශ වල ගොවි ජනතාවට විශාල අර්බුදයකට මුහුණ දීමට සිදුව ඇති බව සඳහන් කලේය.මන්ද,ඉහල ප්‍රදේශ වල කැනීම් හේතුවෙන් ජල උල්පත් සිඳී යාමේ අවධානම මත කුඹුරු අක්කර 175ක පමණ වගා කටයුතු වල යෙදෙන පවුල් 300ක පමණ ප්‍රමාණයකට ඉදිරියේදී ජල හිඟයකට මුහුණ පෑමට සිදුවන බවත්,මේ නිසා වී වගාව සම්පූර්ණයෙන් නතර විය හැකි බවත්,පහල කොටසේ ඉදිවෙමින් පවතින වැව සිඳී යාමේ තර්ජනයක් ඇතිවිය හැකි බවත් පෙන්වා දුන් ගරු මන්ත්‍රීතුමා කිසිදු වග විභාගයකින් තොරව මෙම කැනීම් සිදු කිරීම හේතුවෙන් ජනතාව පත් වන අසීරුතාවය සලකා සංවේදී පරිසර කලාපයක් තුල එම ක්‍රියාවලිය සිදු කිරීම සම්බන්ධයෙන් දැඩි විරෝධය පලකර සිටියේය.

II. අම්බැවිල වැව අසල ප්‍රදේශය නාය යෑමට ලක්ව ඇති බවත් වගකිවයුතු නිලධාරීන් මේ සම්බන්ධයෙන් සොයා බලා කටයුතු කර නොමැති බවත් පෙන්වා දෙමින් ඒ පිළිබඳව සොයබලා ඉදිරි ක්‍රියාමාර්ග ගන්නා මෙන් ඉල්ලා මාර්ග සංවර්ධන අධිකාරිය වෙත ඉල්ලීමක් කරන මෙන් ඉල්ලා සිටියේය.

ඉහත ගරු මන්ත්‍රීතුමා විසින් විරෝධය ප්‍රකාශ කරන ලද කාරණය සම්බන්ධයෙන් අදහස් ඉදිරිපත් කල ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී එන්.වී.ශ්‍රීමාවතී මැතිතුමිය ඉහත කී සෙල්ස්ෆා කැනීම් බල පත්‍රය අදාල සියළුම ආයතන වල සමීක්ෂණ වාර්තා අනුව ලබා ගත් එකක් බවත් පේරාදෙනිය විශ්වවිද්‍යාලය,භූ විද්‍යා හා පතල් කැනීම් කාර්යංශය හා මධ්‍යම පරිසර අධිකාරිය ඇතුළු විෂය ක්ෂේත්‍ර ගණනාවකගේ නිරිදේශ ඇතුලත්ව බලපත්‍ර නිකුත් කර ඇති බවත් සඳහන් කල ඇය එකී සමීක්ෂණ වාර්තා අනුව පරිසර හානියක් සිදු වීමේ අවධානමක් නොපවතින බව පෙන්වා දුන්නාය.මෙහිදී ජනතා විරෝධයක් මතු වුවහොත් තමන් ජනතාව සමඟ පෙරමුණ ගැනීමට ඉදිරිපත් වන බවගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්.අයි.පී.රණතුංග මැතිතුමා ප්‍රකාශ කලේය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.සී.එස්.කේ.ඉසුරුමුණි මැතිතුමා ඉහත කරුණ සම්බන්ධයෙන් අදහස් දක්වමින්,ප්‍රදේශයේ පවතින ඛනිජ සම්පත් වලින් ප්‍රයෝජන ගතයුතු බවත්,ඒ තුලින් විදේශ විනිමය උපයා ගත හැකි බවත්, ප්‍රදේශයේ ජනතාවට වන හානි අවම කිරීමට නීතිමය රාමුවක් තුල සිට කටයුතු කල යුතු බවත් සඳහන් කරන ලදී.

ඉහත ඛනිජ ද්‍රව්‍ය කැනීම් හේතුවෙන් ජල මූලාශ්‍ර සිදී යෑමේ තර්ජනයට ලක්ව ඇති අතර ඒ ආසන්නයේ පවතින ලියාපදිංචි ආරණ්‍ය සේනාසනයේ වැඩවසන ස්වාමීන් වහන්සේලාට බණ භාවනා කිරීමටද බාදා පැමිණෙන බවත් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.බුද්ධික වීරසිංහ මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

## 5. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.ඒ.දමිත් විජේරත්න මැතිතුමා

ලැබුවා වූ 2019 වසර සැමට සුභ නව වසරක් වේවායි සුභාශිංසනය කරමින් අදහස් දැක්වූ ගරු මන්ත්‍රීතුමා රංවල මාර්ගය සංවර්ධනය කිරීමට අදාලව ඇඹිලිපිටිය හා පැල්මඩුල්ල මාර්ග සංවර්ධන අධිකාරී එක්ව ඇස්තමේන්තුවක් සකස්කර ඇති අතර ඒ සඳහා ආර්ථික කටයුතු අමාත්‍යංශයෙන් මුදල් ප්‍රතිපාදන වෙන්වී ඇති බව දන්වා සිටියේය.පක්ෂ භේදයකින් තොරව ගරු බුද්ධික වීරසිංහ මැතිතුමා ඇතුළු සියළුම මන්ත්‍රී මණ්ඩලයේ සහයෝගයෙන් එම මුදල් ප්‍රතිපාදන ලබාගෙන මාර්ගය සංවර්ධනය කිරීමට එක්ව ක්‍රියාකල යුතු බව ගරු මන්ත්‍රීතුමා විසින් වැඩිදුරටත් පැවසීය.

## 6. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.එල්.ලාල් කුමාරරත්න මැතිතුමා

හඳගිරිය සහ සදගනාපුර ප්‍රදේශයේ ජනතාව දැඩි මාර්ග දුෂ්කරතාවන්ට හා බීමටවත් ජලය නොමැති වීමෙන් පීඩාවන්ට ලක් වන බවත්, පවතින බස් රථයද අබලන්වීම හේතුවෙන් නිසි ලෙස ධාවනය නොවන බවටත් කරුණු අනාවරණය කල අතර සභාවේ JCB යන්ත්‍රය යොදා මාර්ගය යම් පමණකින් හෝ පිළිසකර කරදෙන ලෙසත්,ඩිපෝ අදිකාරිය සමග සාකච්ඡා කර බස් රථයක් ලබා දෙන ලෙසත් ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලා සිටින ලදී.

**සභා රැස්වීමේ නිමාව**

ඉදිරි වසර තුල සැලසුම් සහගත ලෙස ගරු මන්ත්‍රීතුමන්ලාගේ යෝජනා ක්‍රියාත්මක වන පරිදි ප්‍රාදේශීය සභාවේ සේවා ව්‍යාප්ත කිරීමට කටයුතු කරන බවත්,සභා ගොඩනැගිල්ලේ උඩුමහල සෑදීම හා වැලිගෙපොල පොළ හා කඩ කාමර සෑදීමට මේ වන විට මූලික කටයුතු සිදු කරමින් පවතින බැවින් ඉදිරි වසරේ සභාවේ ආදායම් මාර්ග වැඩිකර ගැනීමට කටයුතු සිදු කරන බවත් ප්‍රකාශ කල ගරු සභාපතිතුමා සියළුදෙනා එක්ව සහයෝගයෙන් නව වසරේ කටයුතු කරගෙන යාමට සුභ පැතුම් එක් කරමින් පස්වරු.1.00 ට සභාවේ වැඩ නිමාවට පත් කරන ලදී.

කැළුම් ප්‍රියංකර ජයසිංහ,

සභාපති,

වැලිගෙපොල ප්‍රාදේශීය සභාව